# රේඩියෝ ගුරුවරයා


අංක 1 | I පත්‍රය | මිනිත්තු 45

**2020 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඇසුරින් සකස් කරන ලද පෙර පුහුණු ප්‍රශ්න පත්‍රය**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.


- පහත දී ඇති රූප තුනෙන් අනෙක් රූප දෙකට වඩා එක් රූපයක් වෙනස් ය. වෙනස් රූපය තෝරා යටින් ඉරක් අඳින්න.

(1)



1 2 3

(2)



1 2 3

- හිස්තැනට ගැලපෙන රූපය තෝරා එයට යටින් ඉරක් අඳින්න.

(3) මිතුරා -සතුරා , නයා - ..............................

(1) තලගොයා (2) පිඹුරා (3) මුගටියාය

(4) මව -මෑණියෝ ,බිරිඳ -..............................

(1) ගැහැනිය (2) කාන්තාව (3) භාර්යාව

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(5) (1) වෛවර්ණ (2) වයිවර්ණ (3)වෛවර්න

(6) (1) පවුරානික (2) පෞරාණික (3)පොරාණිඛ

(7) (1) පෘතුග්‍රීසීන් (2) පෘතුගීසීන් (3) පෘථිගීසීන්

- පහත සඳහන් සංඛ්‍යා රටාවේ හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරා ඉරක් අඳින්න.

(8) 2,7, ............... 23,34,47

(1) 12 (2) 14 (3) 10

(9) AMD ⟶ DAM ⟶ MDA ⟶ ...............

හිස්තැනට ආයුතු සංඛ්‍යාව වන්නේ,


(1) AMD (2) DMA (3) MAD

(10) රටාව අනුව ඊ ළඟට ආයුතු රූපය වන්නේ,



1 2 3

(11) හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,




(1) 15 (2) 24 (3) 20

(12)වසර තුනකට පෙර අයියාගේ වයස මල්ලීලේ වයසේ දෙගුණයට වඩා පහක් වැඩිය. දැන් මල්ලීගේ වයස අවුරුදු 12 නම් අයියාගේ වයස කීය ද?

(1) අවුරුදු 26 කි. (2) අවුරුදු 30 කි. (3) අවුරුදු 19 කි.

(13) මැයි මාසයේ 08 වෙනිදා සඳුදාවකි. එම මාසයට ඇති අඟහරුවාදා සහ බදාදා ඇති දින ගණන පිළිවෙලින්

(1) 4 , 5 කි. (2) 5 ,5 කි. (3) 5 ,4 කි.


(14) සංඛ්‍යාවකට 4 ක් එකතු කර එය 5න් ගුණ කර දෙකෙන් බෙදා එයට 7 ක් එකතු කළ විට ලැබෙන අගය 27 කි. මුල් සංඛ්‍යාව කීය ද?

(1) 7 කි. (2) 4 කි. (3) 8 කි.

(15) වැලක නිල් ,රතු, සුදු,කොළ වශයෙන් කොඩි 65 ක් එල්ලා ඇත. 36 වන කොඩියේ වර්ණය කුමක් ද?

(1) නිල් (2) සුදු (3) කොළ

- පහත රූපය ඇසුරින් පිළිතුරු සපයන්න.




(16) එක් ක්‍රීඩාවකට පමණක් කැමති ළමයි සංඛ්‍යාව කොපමණ ද?

(1) 12 (2) 16 (3) 20

(17) ක්‍රීඩා දෙකකට පමණක් කැමති ළමයි සංඛ්‍යාව කොපමණ ද?

(1) 17 (2) 10 (3) 25

(18) ක්‍රීඩා තුනටම කැමති ළමයි සංඛ්‍යාව කොපමණ ද?

(1) 7 (2) 4 (3) 5

(19) පියල් නම් දරා සිටියේ කපටි වැඩ කරන පුද්ගලයෙකු ලෙසට ය. ඔහු ගමේ ළඟදී පදිංචියට පැමිණි එවැනි හැසිරීමක් ඇති සරත් ඇසුරු කරන්නට විය. මේ සඳහා සුදුසු ප්‍රස්ථාව පිරුළ වන්නේ ,

(1) කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ (2) රයිගමයයි ගම්පළයයි වගේ

(3) පරංගියා කෝට්ටේ ගියා වගේ

(20 400 න් බාගයට 50 ක් එකතු කර 2 න් බෙදූ විට පිළිතුර වන්නේ,

(1) 200 කි. (2) 125 කි. (3) 100 කි.

(21) අනිද්දා 12 වෙනි සිකුරාදා නම් පෙරේ දා කවදා ද?

(1) 8 වෙනි සඳුදා (2) 9 වෙනි අඟහරුවාදා (3) 10 වෙනි බදාදා

(22) ඉටිපන්දමක් දැල්වී අවසන් වීමට මිනිත්තු 15 ක් ගතවේ. එවැනි ඉටිපන්දම් 10 ක් එකවර දැල් වූයේ නම් සියල්ල නිවී යාමට කොපමණ වේලාවක් ගත වේ ද?

(1) මිනිත්තු 20 කි. (2) මිනිත්තු 15කි. (3) මිනිත්තු 150 කි.

(23) හෝටලයක සෑම දිනකම උදෑසන 5.00 ට ටැංකියකට ජලය පුරවයි. සෑම පැයකටම වරක් හෝටලයේ පරිභෝජනය සඳහා ජලය ලීටර 50 ක් ප්‍රයෝජනයට ගනී. වේලාව 15:00 වන විට ප්‍රයෝජනයටගෙන ඇති ජල ප්‍රමාණය කොපමණ ද?

(1) ලීටර 100 යි (2) ලීටර 950 යි (3) ලීටර 500 යි


(24) කම්හලක සීනුවක් පැය 4 කට වරක් නාද වෙයි. තවත් කම්හලක සීනුවක් පැය 3 කට වරක් නාද වෙයි. පෙ.ව. කම්හල් දෙකේම සීනු එකවර නාද වූයේ නම් නැවත සීනු දෙකම එකවර නාදවන්නේ කීයට ද?

(1) පෙ.ව. 9.00 (2) ප.ව. 6.00 (3) ප.ව 2.00

(25) සිමෙන්ති කොට්ටයක බර

(1) 500 kg (2) 50 kg (3) 500 g

- දී ඇති ඝනවස්තු ඇසුරින් පිළිතුරු ලියන්න.



1 2

(26) මෙම ඝනවස්තු දෙක එකතු කළ විට සෑදෙන ඝනවස්තුව


(1) සමචතුරස්‍රයකි. (2) ඍජුකෝණාස්‍රයකි. (3) ඝනකාභයකි.

(27) අංක 2 න් දැක්වෙන ඝනකයේ ඊතලයෙන් දැක්වෙන්නේ,

(1) සැලැස්මයි. (2) පැතිපෙනුමයි. (3) ඉදිරිපෙනුමයි.

(28)මීටර 60 ක් දිග තාප්පයක් දිගේ මීටර 5න් 5 ට මල් පෝච්චි තැබීමට මල් පෝච්චි කීයක් අවශ්‍ය ද?

(1) 12 යි. (2) 11 යි. (3) 10 යි.



(29) මෙහි ඇති ත්‍රිකෝණ ගණන වන්නේ ,

(1) 13 කි. (2) 11 කි. (3) 15 කි.

(30) මෙහි ඇති ඍජුකෝණාස්‍ර ගණන වන්නේ ,

(1) 1 කි. (2) 3 කි. (3) 5 කි.

- කවිය ඇසුරින් පිළිතුරු ලියන්න.

පලා පැහැය හැම කල්හි ම - රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද - දලු ලා යළි පැළ වේ

(31) මෙයින් කියවෙන්නේ,

(1) පොළොවේ සෑම ස්ථානයකම පලා වර්ග තිබෙන බවයි.

(2) පොළොව සරු සාර බවයි.

(3) ඉවත දමන දඬු යළි කිසි දිනක පැළ නොවන බවයි.

(32)බඳුනක ජලය ලීටර 30 ක් ඇත. එය එම බඳුනෙන් 1/4 කි. බඳුනට අල්ලන ජල ප්‍රමාණය වන්නේ,

(1) ලීටර 60 කි (2) ලීටර 120 කි (3) ලීටර 90 කි

(33) වානකට වරකට බෙහෙත් පෙති 3 බැගින් පැය 6 කට වරක් බීමට බෙහෙත් පෙති ලබා දෙන ලදී. දින 3 කට අවශ්‍ය බෙහෙත් පෙති ගණන වනුයේ,

(1) 36 කි (2) 24 කි (3) 18 කි

(34) දර්ශන මීටර 2 සෙන්ටිමීටර 40 ක් දිග කම්බියක් හරි මැදින් දෙකට කපා එක් කැබැල්ලකින් සමචතුරස්‍රයක් සාදන ලදී. එහි පැත්තක දිග සෙන්ටිමීටර කීය ද?

(1) 60 cm කි. (2) 40 cm කි. (3) 30 cm කි.

(35) ඉතිරි කැබැල්ලෙන් සමපාද ත්‍රිකෝණයක් සෑදුවේ නම් එහි පාදයක දිග කොපමණ ද?

(1) 20 cm කි. (2) 15 cm කි. (3) 40 cm කි.

(36)ගුණරත්න සෑම වසරක ම පාහේ වන්දනා නඩ රැගෙන වට වන්දනාවේ යයි. මෙහි ගුණරත්න

(1) රියදුරෙකි (2) වෙළෙන්දෙකි (3) නඩේගුරෙකිව

- හිස්තැන්වලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(37) ගංවතරෙන් ......................පත් මිනිස්සු.................. ඉල්ලූ හ.

(1) සතුටට , ආහාර (2) පීඩාවට , ආධාර (3) පීඩාවට , ජලය

(38) නොගැලපෙන වචනයක් ඇති පේළිය තෝරන්න.

(1)ගවුම ,කමිසය, සාරිය ,කලිසම (2) අඹ , කෙසෙල්, ලොවි, නාරං

(3) රෝස , අරලිය , නෙල්ලි , සමන්පිච්ච

(39) විශාලත්වය අනුව අනුපිළිවෙළ තෝරන්න.

(1) මීයා , බළලා, බල්ලා , සිංහයා (2) සිංහයා , බල්ලා ,බළලා ,මීයා

(3) බල්ලා ,සිංහයා , මීයා , බළලා

(40) මෙම අකුරු පේළියේ ස්වර අක්ෂර රවුම් කරන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජ් | ප | අ | ඉ | ට | ඒ | න | ඔ | ක |

**මේ ප්‍රශ්න පත්‍රයේ II කොටස හෙට (25) දින පළ වේ**

**රේඩියෝ ගුරුවරයා ආචාර්ය මණ්ඩලය** - ප්‍රියන්ත කේ ගීගනගේ මහතා - කොළඹ ආනන්ද විද්‍යාලය, ශ්‍යාමලී ප්‍රියංගිකා කුමානායක මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුහානි පල්ලෙවෙල මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ගයනි දේවරාජ් මිය - කොළඹ ලුම්බිණි විද්‍යාලය, මංජුල උස්හෙට්ටි මහතා - ප්‍රාථමික පුහුණු (විද්‍යාපීඨ) සහ ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),

රේඩියෝ ගුරුවරයා සෑම බදාදා දිනකම පෙ.ව. 10.00 -11.00 සහ ප.ව. 4.00 – 5.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය සහ විදුල ළමා ගුවන්විදුලියෙන් (තරංග මාලා 91.7 FM / 91.9 FM) ප්‍රචාරය වන අතර වැඩසටහනට අදාළ ප්‍රශ්න පත්‍රය බදාදා දිනමිණ සමග ඔබට ලබා ගත හැකිය. නිෂ්පාදනය - සුමනා අබේසිංහ සහ සුභානි වැලිවිට

අංක 1 II පත්‍රය පැය. 01 මිනිත්තු 15

**2020 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඇසුරින් සකස් කරන ලද පෙර පුහුණු ප්‍රශ්න පත්‍රය**

(1) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වනය ඉතා අලංකාර ය. සැම තැනක ම ඇති ගස් වැල් සහ ඒවායේ හට ගන්නා මල් සහ ගෙඩි එහි අලංකාර බව තවත් වැඩි කරයි. ගස් වැල් බහුල නිසා දවල් කාලයේ ද වනය අඳුරු ස්වභාවයක් උසුලයි. බැලූ බැල්මට ඒ අන්ධකාරය බියකරු ලෙස පෙනුණ ද වනය බෙහෙවින් සුන්දර ය. තැන් තැන් වලින් ගලා යන ඇළ දොළවල් නිසා වනය පුරා ම ඇත්තේ සිසිලසකි. තිත්ත පැටවු ඇළ දොළ වල පීනන ආකාරය ඉතාමත් දැකුම්කලු ය. දිය දහරා ගලා .හඬ වනයේ ඇති නිහඬ බව බිඳ දමයි.

(i) මෙයින් විස්තර වන්නේ දවසේ කුමන කාලයක් පිළිබඳව ද? ..........................................

(iii) මෙහි සඳහන් යුගල පදයක් ඡේදයෙන් තෝරා ලියන්න ..........................................

(iii) නාම විශේෂණ පදයක් ඡේදයෙන්ම තෝරා ලියන්න ..........................................

(iv) දහවල් කාලයේ ද වනය අඳුරු ස්වභාවයක් උසුලන්නේ ඇයි ? ..........................................

(v) මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න..........................................

(vi) ප්‍රාණවාචී බහු වචන පදයක් ඡේදයෙන් තෝරා ලියන්න..........................................

(vii)මෙම ඡේදයට සුදුසු මාතෘකාවක් ලියන්න ..........................................

(viii)එකිනෙකට විරුද්ධ පද දෙකක් ඡේදයෙහි ඇත. එය තෝරා ලියන්න..........................................

(ලකුණු 08)

(2) පහත දැක්වෙන කවියේ ඉතිරි පදය ලියන්න.

මුනි සිරිපා සිඹිමින් නේ
සමනොළ ගිරි පෙදෙසින් නේ
මඳ සුළඟයි මේ එන්නේ
..........................................

(ලකුණු 02)

(3) පහත ප්‍රස්ථාපිරුළ සම්පූර්ණ කරන්න.ල්ල

(I) කට නිසා ..........................................නැහුණා වගේ

(ලකුණු 01)

(4) සුදුසු විරාම ලකුණු යොදන්න.

(I) බැහැ පඬිතුමනි තොටියා කිවුවේ ය

(II) එයින් වන සතුන් ද ආරක්ෂා වේ

(ලකුණු 03)

(5) පහත දැක්වෙන තේරවිල්ල තෝරා හිස්තැනෙහි ලියන්න.

(I) ගසක නොපිපෙන මල -..........................................

(ලකුණු 01)

(6) පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු නාම පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(I) ඔල්සන් ස්කැන්ඩිනේවියානු ජාතිකයෙකි. .................. අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ සේවය කළේ ය.

(II) අභ්‍යවකාශ මධ්‍යස්ථානයක පක්ෂියකු සිටිය හැකි ය. ............. අමතර වියදමක් නැතිව ආරක්ෂාව සපයනු ඇත.

(ලකුණු 02)

(7) සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරන්න.

(I) මල් වැහි .............. (වසියි/ වසිති)

(II) කිරි කුරහන් ............. (පීදෙයි/ පීදෙති)

(III) ගෙයි අටු කොටු ............ (පිරෙයි/ පිරෙති)

(ලකුණ 03)

(8) පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවයලට පිළිතුරු ලියන්න.

නින්දට යන තැන
කුල දෙවි වඳිමින
කටයුතු පසු දින
සලකයි නුවණින

මෙහි සඳහන් ආකාරයට නින්දා යාමට පෙර සිදු කරන ක්‍රියාව කුමක් ?..........................................

(ලකුණු 02)

(09) නිවැරදි අක්ෂරය යොදා වචනය සම්පූර්ණ කරන්න.

(I) ලේ............නය (ඛ, ක) (II)ප්‍රදර්............නය(ෂ,ශ)

(ලකුණු 02)

(10) වරහන් තුළ ඇති පදවලින් සුදුසු පදය තෝරා හිස්තැනෙහි ලියන්න.

(I) (ළමයා) . . . . . . . . . . . . . . . පුස්තකාලයට යයි.

(II)(ඔවුහු/ඔවුන්) . . . . . . . . . . . . පලතුරු කෑවෝ ය.

(ලකුණු 02)

(11) කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ යනු ප්‍රසිද්ධ කියමනකි. පොත් කියවීම විනෝදාංශයක් කර ගත යුතු ය. පොත් කියවීමෙන් ලැබෙන ප්‍රයෝජන රැසකි. ''පොත් කියවීමේ අගය' යන මාතෘකාව පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.

(I)..........................................

..........................................

(II)..........................................


..........................................

(III)..........................................

..........................................

(ලකුණු 06)

(12) පහත දැක්වෙන රූපවලට ගැලපෙන වචනය හිස්තැනෙහි ලියන්න.

.................................. .................................. ..................................

(ලකුණු 03)

(13) පහත දැක්වෙන ඉංග්‍රීසි වාක්‍යවල තේරුම සිංහලෙන් ලියන්න.

(I) I have a pet..........................................

(II) I can dannce..........................................

(III)How old are you?..........................................

(ලකුණු 03)

(14) පහත දැක්වෙන දෙමළ වාක්‍යයේ තේරුම සිංහලෙන් ලියන්න.

(I) අම්මා ඉරුක්කිරාර් ?..........................................

(ලකුණු 01)

(15) පහත දැක්වෙන සිංහල වැකියේතේරුම දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

(I) ගුරුවරයා එහේ ඉන්නවා ?..........................................

(ලකුණු 01)

(16) පහත දැක්වෙන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.


අනූ නව දහස් නවසීය අනූ නවය-..........................................

(17) හිස්තැනට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

| 42 301 | + | | = | 94 532 |
|---|---|---|---|---|

(18) (I) මෙම ඝන වස්තුව හඳුන්වන නම කුමක් ද?..........................................


(II) එහි ශීර්ෂ හා පාද සංඛ්‍යවෙහි එකතුව කීය ද?..........................................



(19) රවුම තුළ ඇති සංඛ්‍යාවලින් දෙකෙහි ගුණාකාර හා හතරෙහි ගුණාකාර තෝරා ලියන්න.

(I) දෙකෙහි ගුණාකාර - ..........................................

(II) හතරෙහි ගුණාකාර -..........................................





(20) කොළඹ බස් නැවතුමෙන් පෙ.ව. 8.40 ට නුවර බලා පිටත්වීමට නියමිතව තිබූ බස් රථය විනාඩි 15 ක් ප්‍රමාදව නුවර බලා පිටත් විය. නිට්ටඹුවේදී තේ පානය සඳහා තවත් විනාඩි 15 ක් ගත කළ අතර ප.ව. 12.10 ට බස් රථය නුවරට ළඟාවිය. බස් රථය ධාවනයේ යෙදී තිබූ කාලය කොපමණ ද?..........................................

(21) පහත දැක්වෙන රටාවේ ඊළඟට ආයුතු සංඛ්‍යා ලියන්න.

4,16,5,25,6,36,................ , ................

(22) රවුමෙහි ඇති ඔත්තේ සංඛ්‍යාවල එකතුවෙන් ඉරට්ටේ සංඛ්‍යාවල එකතුව අඩු කර හිස්තැනෙහි ලියන්න.




..........................................

(23) A නගරයේ සිට B නගරය හරහා C නගරය දක්වා ඇති මාර්ගයේ දිග 12 km 550 m කි. එම මාර්ගයේ A සිට B තෙක් දිග 7km 750m නම් B සිට C දක්වා දිග කොපමණ ද?.................

(24) අමල්කාගේ වයස හා දුලානිගේ වයස්වල එකතුව අවුරුදු 15 කි. අමල්කාට වඩා දුලානිගේ වයස අවුරුදු 4 ක් වැඩිය. අමල්කාගේ වයස කීය ද?..........................................

(25) සීනි 1kg හා තේකුඩු 500 g ක මිල රුපියල් 290 ක් වේ. සීනි 1 kg ක හා පරිප්පු 500 g ක මිල රුපියල් 190 ක් වේ. සීනි 1 kg ,පරිප්පු 500 g හා තේ කුඩු 500 g ක මිල රුපියල් 390 ක් වේ. පරිප්පු 1 kg ක මිල සොයන්න..........................................

(26) නාගරික පෙදෙසක පැල්පත්වාසින්ගෙන් 5/7 ක් පදික වෙළඳාම් කරති. එම පිරිස 500 ක් නම් ගමේ ඉතිරි පිරිස සොයන්න. ..........................................

(27) ලොකු පෙට්ටියක බිස්කට් 8kg ක් ඇත.ඒවා පැකට් ලෙස අසුරා ඇති අතර පැකට් 2 බැගින් කුඩා පෙට්ටි 10 කට දමා ඇත. පැකට් එකක බර කොපමණ ද?..........................................

(28)මිනිත්තුවකට ජලය ලීටර 20 බැගින් ටැංකිකට ගලා එන්නේ නම් ලීටර 2000 ක් අල්ලන ටැංකියක් පිරවීමට ගතවන කාලය මිනිත්තු කීය ද? ..........................................

(29) සඳරුවන් කඩයට ගොස් බඩු මිලදී ගත් අතර ඔහුගේ බිල රු.147.50 ක් විය. එම මුදල නෝට්ටු 3 ක් හා කාසි 3 කින් ගෙවිය හැකි ආකාරය ලියන්න . .....................................

(30) පහතක දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | ඒකක මිල රු.සත | මිලදී ගත් ප්‍රමාණය | මිල රු.සත |
|---|---|---|---|
| හාල් | 98.00 | 2½ kg | ........................... |
| සීනි | .................. | 1½ kg | 135.00 |
| පොත් | 18.00 | 10 | ............................. |
| තෙල් | 220.00 | ....................... | 660.00 |
| එකතුව | | | ............................. |

(ලකුණු 28)

- සුදුසු පිළිතුර යටින් ඉරක්අඳින්න.

(31) ''යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැගිලා පරංගි'' යන ගීතය,

(I) දේශාභිමානී ගීතයකි (II) ජන ගීතයකි (III)හටන් කාව්‍යකි (IV)සරල ගීතයකි

(32) එඬරු ව්‍යාප්ත වන්නේ,

(I) සතුන් මඟිනි (II) ජලය මඟිනි (III)පිපිරීමෙනි (IV) සුළඟ මඟිනි

(33) මාංශ භක්ෂක සත්ත්වයෙකි.

(I) ගවයා (II)බත්කූරා (III) බල්ලා (IV) සමනලයා

(34) පත්‍ර ආශ්‍රයෙන් සිය වාසස්ථාන සකසා ගනී.

(I) වේයා (II) මීයා (III) දිමියා (IV) කුරුමිණියා

(35) නරියා මඟින් බෝවිය හැකි රෝගයකි.

(I) සෙංගමාලය (II) මී උණ (III) ජලභීතිකාව (IV) උණ

(36) ආදේශක සංගීත භාණ්ඩයක් නොවේ.

(I) පැපොල් බට නළාව (II) උණ බට බෙරය

(III)එක්ස්රේ කොළ රබාන (IV) බට නළාව

(37)වඩුවා විසින් ලීයක් සිදුරු කරගැනීමට භාවිත කරයි.


(I) මිටිය (II) කියත (III) නියන (IV) ඉස්කුරුප්පු නියන


(38) ගෙවත්තක බෝග වගාකර ගැනීමෙන් ඇතිවන වාසියක් නොවේ.

(I) රසායනික බෙහෙත් වලින් තොර ආහාර ලබා ගැනීම (II) අලුත් අහාර ලබා ගැනීම

(III) අපතේ යෑම වැඩිවීම (IV) මුදල් ඉතිරි වීම

(39) පහත දැක්වෙන පින්තූර වලින් ආනන්ද කුමාරස්වාමි මහතා දැක්වෙන පින්තූරය තෝරා ඉරක් අඳින්න.



(40) වේලීම මඟින් කල්තබා ගත හැකි ආහාරයකි.

(I) අච්චාරු (II) බිලිං (III) තක්කාලි (IV) වෙරළු

(41) ශීතකරණයක දොර වැසීම සඳහා යොදා ගනී.

(I) කප්පි (II) ආනත තල (III) ලීවර (IV) කාන්දම්

(42) රෝදයක් පහසුවෙන් ක්‍රියා කරවීමට යොදා ගනී,

(I) පෙට්‍රල් (II) ග්‍රීස් (III)තාර (IV) ජලය

(43) වී ගොවිතැනේ දී වගාව ආරක්ෂා කිරීමට යොදා ගනී,

(I) දිය හොල්මන (II) දඬුවැට (III) පිට වැට (IV) ගිනිමැල


(44) විදෙස් තොරතුරු ක්ෂණිවකව ලබා ගත හැකි මාධ්‍යකි

(I) අන්තර් ජාලය (II) පුවත්පත් (III) ලිපි (IV) පෝස්ටර්

(45) ''අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතු යි'' යනුවෙන් පැවසුවේ,

(I) දුටුගැමුණු රජතුමා (II) මහා පරාක්‍රමබාහු රජතුමා

(III) කාශ්‍යප රජතුමා (IV) ධාතුසේන රජතුමා



(46) රූපසටහනෙහි දැක්වෙන්නේ

(I) කොලාප් නිර්මාණයකි (II) පලාපෙති නිර්මාණයකි

(III)ලියවැල් නිර්මාණයකි (IV) කැටයමකි

(47) ''ජලයට නිශ්චිත හැඩයක් නැත'' මෙම කියමන

(I) අසත්‍යකි (II) සත්‍යකි

(III) අර්ධ සත්‍යකි (IV) කිව නොහැක

(48) කුමාර ගසකට නැග්ග විට ඔහු බිම ඇද වැටුණි. ඔහුගේ පාදය අස්ථි බිඳී ඇති අතර ඔහුට ඉදගැනීමට පවා නොහැකිය. අසල්වාසීන් පැමිණ ඔහු රෝහලට ගෙනයාමට සූදානම් විය. ඒ සඳහා වඩාත් සුදුසුම ක්‍රමය වන්නේ

(I) ඔහුව ඔසවාගෙන යාමයි (II) කෙසේ හෝ ඇවිද්දවාගෙන යාමයි

(III)බිඳුණු පාදයට යටින් ලී පටියක් තබා බැඳ ලෑල්ලක් මත තබා ඔසවාගෙන යාමයි

(IV) රෝද පුටුවක ගෙනයාමයි

(49) සීගිරිය පිහිටා ඇත්තේ

(I) පොලොන්නරුවේ ය (II)අනුරාධපුරයේ ය (III)දඹුල්ලේ ය (IV) මාතලේ ය

(50) දකුණු පළාතේ ප්‍රධාන නගරය වන්නේ

(I) මාතර (II) හම්බන්තොට (III) බලපිටිය (IV) ගාල්ල

(51) පහත දැක්වෙන රූපික ප්‍රකාශනයෙන් අදහස් වන්නේ



(I) වාහන නතර කර තැබීම තහනම් (III) පළල් මාර්ගය

(II) වාහන ඇතුල් කිරීම තහනම් (IV) නළා ශබ්ද කිරීම තහනම්

(52) අතු කැබලි සිටු වීම මඟින් පැළ ලබාගතහැකි බෝග වර්ගය කුමක් ද? කරන්න

(I) මිරිස් (II)තක්කාලි (III)බතල (IV)රම්පෙ

(53) රූපයේ දැක්වෙන වල් පිච්ච පුෂ්පය නියෝජනය කරන පළාත වන්නේ



(I) දකුණු පළාත

(II) උතුරු පළාත

(III) නැගෙනහිර පළාතක

(IV) සබරගමු පළාත

(54) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් ගණන

(I) 22 (II) 24 (III) 25 (IV) 26

(55) ජන ක්‍රීඩාවක් නොවේ,

(I)ඔළිඳ කෙළිය (II) පංචා දැමීම (III) එළුවන් කෑම (IV) ගම හරහා දිවීම

(56) වාහන සඳහා ආලෝක සංඥා කුලුනේ ඇති කහ පැහැති වර්ණය දැල්වුණි මෙයින් අදහස් කරන්නේ,

(I) වාහනය නතර කරන්න (II) රථය ගමනට සූදානම් කරන්න

(III) ගමන ආරම්භ කරන්න (IV) ඉක්මනින් ගමන් කරන්න

**රේඩියෝ ගුරුවරයා ආචාර්ය මණ්ඩලය** - ප්‍රියන්ත කේ ගීගනගේ මහතා - කොළඹ ආනන්ද විද්‍යාලය, ශ්‍යාමලී ප්‍රියංගිකා කුමානායක මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුභානි පල්ලෙවෙල මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ගයනි දේවරාජ මිය - කොළඹ ලුම්බිණි විද්‍යාලය, මංජුල උස්හෙට්ටි මහතා - ප්‍රාථමික පුහුණු (විද්‍යාපීඨ) සහ ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),

රේඩියෝ ගුරුවරයා සෑම බදදා දිනකම පෙ.ව. 10.00 -11.00 සහ ප.ව. 4.00 – 5.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය සහ විදුල ළමා ගුවන්විදුලියෙන් (තරංග මාලා 91.7 FM / 91.9 FM) ප්‍රචාරය වන අතර වැඩසටහනට අදාළ ප්‍රශ්න පත්‍රය බදාදා දිනමිණ සමග ඔබට ලබා ගත හැකිය. නිෂ්පාදනය - සුමනා අබේසිංහ සහ සුභානි වැලිවිට